**නැගෙනහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට සීමිත පදනමින් බඳවාගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019**

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට සීමිත පදනමින් බඳවාගැනීම සඳහා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාත් පරිවාස නිලධාරි තනතුරේ I ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.07.18 වේ. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**02. උසස්කිරීම සඳහා වන සේවා කොන්දේසි :-**

2.1 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගැනීම සිදු කරනු ලැබේ.

2.2 ඉහත සඳහන් තනතුර සඳහා නැගෙනහිර පළාත් පරිවාස නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියේ සුදුසුකම් සපුරන ලද නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයකින් තොරව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. වැටුප ඃ-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට අනුව,
රු. 41,580-11x755-18x1030- රු. 68,425/- වේ. (MN-7-2016)

**04. පොදු සුදුසුකම් ඃ-**

4.1 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

**05. බඳවාගැනීමේ ක්‍රමය :-**

5.1 නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුර සඳහා වන අනුමත බඳවාගැනීමේ පරිපාටිය හා ඉහත 2.2 හි විධිවිධානවලට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයක ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

5.2 සෑම අයදුම්කරුවකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත සුදුසුකම් වලට අදාළ පරික්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06. ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට බඳවාගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අවශ්‍යවන සුදුසුකම්**

**i. වයස් සීමාව**

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සිට අයදුම්කරන අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**ii. යෝග්‍යතාවය**

I. පරිවාස නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියේ සේවය කරන හා නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී ඇති නිලධාරියෙකු වීම.

**iii.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ-**

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු |
|---|---|
| (i) ජ්‍යෙෂ්ඨතාවය | 30 |
| (ii) සේවා පළපුරුද්ද | 15 |
| (iii) අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| (iv) වෙනත් සුදුසුකම් | 20 |
| (v) සම්මුඛ පරීක්‍ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| **මුළු ලකුණු** | 100 |

**iv. ලකුණු ලබාදීමේ පිළිවෙළ**

**(i) සේවා පළපුරුද්ද**

a) පරිවාස නිලධාරි I වන ශ්‍රේණියෙහි සේවය කරන ලද එක් එක් පූර්ණ වර්ෂය සඳහා වසරකට ලකුණු තුනක් (03) බැගින් හිමි වේ.

b) පරිවාස නිලධාරි I වන ශ්‍රේණියෙහි සේවය කරන ලද වසරකට අඩු නමුත් මාස 06 කට වැඩි කාලයක් සඳහා ලකුණු දෙකක් (02) හිමි වේ.

c) පරිවාස නිලධාරි I වන ශ්‍රේණියෙහි සේවය කරන ලද මාස 06 අඩු නමුත් මාස 03 කට වැඩි කාලයක් සඳහා ලකුණු එකක් (01) හිමි වේ.

d) පරිවාස නිලධාරි I වන ශ්‍රේණියෙහි සේවය කරන ලද මාස තුනකට අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.

**(ii) කුසලතාවය**

a) ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා එක් පූර්ණ වර්ෂයකට ලකුණු තුනක් (03) බැගින් හිමි වේ.

b) ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා වසරකට නොවැඩි හා මාස 06 කට නොඅඩු කාලයක් සඳහා ලකුණු දෙකක් (02) හිමි වේ.

c) ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුරෙහි වැඩ බැලීම සඳහා මාස 06 අඩු නමුත් මාස 03 කට වැඩි කාලයක් සඳහා ලකුණු එකක් (01) හිමි වේ.

d) ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුරෙහි වැඩ බැලීම සඳහා මාස තුනකට අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.

**(iii) අතිරේක අධ්‍යාපන සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්
   - පළමු පන්තියේ උපාධියක් සඳහා ලකුණු 10 ක්ද
   - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් සඳහා ලකුණු 05 ක්ද
   - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සහිත උපාධියක් සඳහා ලකුණු 03 ක්ද හිමිවේ.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත
   - පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 10 ක්ද
   - පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 05 ක්ද හිමිවේ.

3. පිළිගත් ආයතනයකින් ලබාගත් තනතුරේ ප්‍රගතියට අදාල හෝ පරිවාස හා ළමාරක්‍ෂක සේවා සම්බන්ධයෙන් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10 ක් හිමිවේ.

**v. වෙනත් සුදුසුකම්**

a) සම්පූර්ණ කරන ලද එක් එක් විදේශ පුහුණු/ජාතික සමුළු/පුහුණු කඳවුරු/අධ්‍යයන චාරිකා/පර්යේෂණ චාරිකා/ව්‍යාපෘති යෝජනා ආදිය සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10 ක් හිමිවේ.

b) පර්යේෂණ හා ප්‍රකාශන සඳහා උපරිම ලකුණු 10

- නිලධාරියා විසින් පළකරන ලද එක් එක් ග්‍රන්ථය සඳහා ලකුණු 02 බැගින් හිමිවේ.
- නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද එක් එක් පර්යේෂණ නිබන්ධනය සඳහා ලකුණු 01 බැගින් හිමිවේ.

**vi. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය**

සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවයට ලකුණු 05 ක් හිමිවේ.

**07. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

7.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතුය.

7.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට බඳවාගැනීම - 2019" යනුවෙන් සඳහන් කළ යුතුය.

7.3 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

7.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2019.07.18 වැනි දින හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. (ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

එම්.වයි. සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට සීමිත පදනමින් බඳවාගැනීම - 2019**

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ……………………………………

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ……………………………………………………………

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : Mr. PERERA, A.B.C.)

1.2 සම්පූර්ණ නම : ……………………………………………………………

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………

(සිංහලෙන්/දෙමළෙන්) ……………………………………………………………

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

1.5 දුරකතන අංකය : ……………………………………………………………

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ……………………………………………………………

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………

2.2 ස්ථිර ලිපිනය : ……………………………………………………………

(සිංහලෙන්/දෙමළෙන්) ……………………………………………………………

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ……………………………………………………………

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2019.07.18 දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ජනවර්ගය : සිංහල ☐ ශ්‍රී ලාංකික දෙමළ ☐ මුස්ලිම් ☐

(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

**5.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර

සඳහන් කරන්න. : ……………………………………………………………………………

**6.0 නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම්,**

6.1 දෙපාර්තමේන්තුව : ……………………………………………………

6.2 වර්තමාන ශ්‍රේණිය : ……………………………………………………

6.3 වර්තමාන ශ්‍රේණියට උසස්කළ දිනය : ……………………………………………………

**7.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම'විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම'විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, උසස්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ උසස්කිරීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………..……

..……………….…………………..……
අයදුම්කරුගේ අත්සන

**8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………………………….……………..මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ……………...………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

………………………………..
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ……………………..……
සහතික කරන්නාගේ නම : ……………………..……
තනතුර : ……………………..……
ලිපිනය : ……………………..……
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරියෙකු වශයෙන් සේවය කරන ------------------------------------------ මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. උසස් කිරීමේ දැන්වීම ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා ඇති බවද ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවද මෙයින් සහතික කරමි.

………………………………..
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ……………………..……

නම : ……………………..……

තනතුර : ……………………..……

ලිපිනය : ……………………..……

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)